<u>**පුණරීක්ෂණය**</u>

- **1- 5 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන මත ලියා දක්වන්න.**

01. තම බල ප්‍රදේශයේ මංමාවත් ඉදිකිරීම හා නඩත්තු කිරීම ............................................... අයත් කාර්යයක් වේ.
(ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට / ප්‍රාදේශීය සභාවට / මධ්‍යම රජයට)

02. හිරු එළිය, පස, ජලය ආදිය ............................................................................................ සම්පත්වලට අයත් වේ.
(ස්වාභාවික / කෘතිම / භෞතික)

03. කලාවැව සමීපයේ පිහිටි ........................................................................ බුද්ධ ප්‍රතිමාව ශෛලමය නිර්මාණයකි.
(සමාධි / ගල්විහාර / අවුකන)

04. පාසල තුළින් අනාගතයේ දී ඉටුකර ගැනීමට බලාපොරොත්තුවන අරමුණ ........................ තුළින් ප්‍රකාශ වේ.
(මෙහෙවර / දැක්ම / නිල ලාංඡනය)

05. ඔබ ජීවත්වන ප්‍රදේශය අයත් කුඩාම පරිපාලන ඒකකය ........................................................ කොට්ඨාසය වේ.
(ප්‍රාදේශීය ලේකම් / දිස්ත්‍රික් ලේකම් / ග්‍රාම නිලධාරි)

- **අංක 06 - 10 දක්වා ප්‍රශ්නවල ප්‍රකාශ හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.**

06. පාසලක පවත්නා සම්ප්‍රදායයන් ආරක්ෂා කිරීම තුළින් ආත්මාභිමානයෙන් යුතු පිරිසක් බිහිවේ. (..........)

07. පුද්ගලයා සැලසුම් සහගතව වැඩකටයුතු කිරීම තුළින් හිතේ පීඩාකාරී ස්වභාවය වැඩිවේ. (..........)

08. පාසල් සිසුවෙකු තම ඉලක්ක ජයගැනීම සඳහා ක්‍රීඩා හා විෂය සමගාමී කටයුතුවලින් ඈත්විය යුතුය.(..........)

09. පාසල තුළ පවතින සම්පත් ආරක්ෂාකාරී ලෙස පරිහරණය කිරීම තුළින් පාසලේ ගෞරවයද ආරක්ෂා වේ. (..........)

10. පුද්ගලයෙකුට තම හැකියා වර්ධනය කරගෙන අනාගත වෘත්තීය ලෝකය ගොඩනගා ගැනීමට පුහුණු පාඨමාලා වැදගත් වේ. (..........)